ශීර්ෂය 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය-304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පින්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු** නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරන අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා අනුව, දෙපාර්තමේන්තුවේ ඉඩම් වල වටිනාකම රු.3,274,000,000 ක් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් වල වටිනාකම රු.6,735,702 ක ඉඩම් වැඩිදියුණු කිරීමේ වියදම්ද ඇතුළුව රු. 3,280,735,702ක් ලෙස දක්වා තිබුණි.	2014 වර්ෂයේ තක්සේරු අගයට අමතරව ඉඩම් වැඩිදියුණු කිරීමේ වැය විෂය යටතේ 2013 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වැඩි කරන ලද ඇතැම් වියදම් " ඉඩම්" යන වත්කම් කාණ්ඩය යටතේ ප්‍රාග්ධනීත කර ඇත.මෙම වියදම් සියල්ල සත්‍ය වශයෙන් ඉඩම් වැඩිදියුණු කිරීමේ වියදම් ද යන්න සොයා බලා මෙම අගය නිවැරදි කිරීමට 2025 වර්ෂය තුල කටයුතු කරනු ලැබේ.	වෙනස්කම් වලට හේතු සොයා බලා අවශ්‍ය ගැළපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	දෙපාර්තමේන්තුව සතු වාහන 10ක තක්සේරු වටිනාකම රු.49,950,000 ක් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වාහන 7ක වටිනාකම වූ රු.34,175,000 ක් පමණක් දක්වා තිබුණි. එමෙන්ම වටිනාකම රු.16,500,000 ක් වූ ඉතිරි වාහන 03ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	2012 වර්ෂයේ ඇමුණුමේ සඳහන් වාහන 7පමණක් තක්සේරු කර ඇති අතර එහි මුළු අගය 34,175,000.00 වේ. 2018 වර්ෂයේදී එම වාහන 7 පමණක් CIGAS වැඩ සටහනේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර ඇත. නමුත් 2024 වර්ෂයේදී වාහන 10 තක්සේරු කර ඇති අතර 2025 වර්ෂයේ එම වාහන 10 ගිණුම් ගත කර ඇත. ඒ අනුව වටිනාකම රු.16,500,000 ක් වූ ඉතිරි වාහන 03 නව තක්සේරු වාර්තා අනුව මෙම වර්ෂයේ ගිණුම් ගත කර ඇති බව.	ගිණුම්ගත නොකළ සියළුම වත්කම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර ප්‍රවේශය (CResMPA) ව්‍යාපෘතිය මගින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂක ජාල වැඩිදියුණු කිරීම සඳහා අනුමත ඇමරිකානු ඩොලර් මිලියන 4.5 ක ප්‍රතිපාදන යටතේ	මෙම අයිතම් සියල්ල 2025 වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇති බව.	ගිණුම්ගත නොකළ සියළුම වත්කම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

උක්ත ව්‍යාපෘතිය මඟින් ලැබී තිබුණු රු.23,395,371 ක් වූ භාණ්ඩ හා උපකරණ 2024 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් සහ දේපළ පිරියත හා උපකරණ සංචිතය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සේවය අතහැර ගොස් ඇති නිලධාරියකුගෙන් වසර 13කට වැඩි කාලයක සිට අයවිය යුතු එකතුව රු.121,830 ක්, විදේශගතව නැවත වැඩ භාරගෙන නොමැති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.145,568 ක් සහ සේවයෙන් ඉල්ලා අස්වී ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.110,256 ක් වූ එකතුව රු. 377,654ක් අයකරගෙන නොතිබුණි.	ණය අය කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව හා ඇප කරුවන්ගෙන් අය කරන බව දන්වා ලිපි යොමු කර ඇති බව.	නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා සියලු ගැලපීම් සිදු කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,912,600,000ක් වූ අතර මුළු වියදම රු. 486,121,648ක් විය. ඒ අනුව ඉතිරිවීම් රු. 1,426,478,352ක් වූයෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 75%ක් වූ අතර මුළු උපයෝජනය 25%ක් විය.	304-02-01-16-2509 (13) හා (17) යටතේ වූ ප්‍රතිපාදන වටිනාකමෙන් රු.මිලියන 1396.22 ක්ම ඩොප්ලර් රේඩාර් ව්‍යාපෘතියට ලැබුණු ප්‍රතිපාදන වලින් ඉතිරිවීම් වන අතර මෙම ව්‍යාපෘතිය ජපන් ආධාර යටතේ සිදුවන ව්‍යාපෘතියන් වන අතර ඉතිරි කටයුතුද ඔවුන්ගේ උපදේශනයන් යටතේ සිදුවේ. මෙම ඩොප්ලර් රේඩාර් කුළුණු ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වූයේ 2024 දෙසැම්බර් 23 වන දින වන අතර මෙම කටයුතු දෙපාර්තමේන්තු පරිපාලනයෙන් බැහැරව සිදුවන බව.	භාණ්ඩාගාර ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	304-02-01-16-2509(13) ප්‍රාග්ධන වැය විෂය සඳහා වෙන් කරන ලද රු. මිලියන 1,382ක මුළු ප්‍රතිපාදනයම සහ 304-02-01-16-2509(17) ප්‍රාග්ධන වැය විෂය සඳහා වෙන්කල රු.මිලියන 19.2 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ඩොප්ලර් රේඩාර් ව්‍යාපෘති කටයුතු යටතේ ඉදිකිරීම් ආරම්භ කිරීම ප්‍රමාද වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව	භාණ්ඩාගාර ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 94((i) හි සඳහන් විධිවිධාන වලට පටහැනිව කටයුතු කරමින් වැය විෂයයන් දෙකකට ලබා දී තිබුණ ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා එකතුව රු. 1,962,401ක බැරකම් වලට එළඹ තිබුණි.	මෙම වැය විෂයන් සඳහා වෙනත් ඉතිරි වැය විෂයන්ගෙන් ප්‍රතිපාදන මාරුකර ගැනීමට යටත්ව 2024 වර්ෂයේ අත්‍යවශයෙන් ඉටු කර ගත යුතු සපයා ගැනීම් සඳහා, සඳහන් කර ඇති වැය විෂයන් යටතේ බැදීම් ඇති කර ගෙන ඇති බව.	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	බැඳීම් හා බැරකම් ඉදිරි වර්ෂයට ගෙන යා හැක්කේ එම සම්පූර්ණ නොවූ බැඳීම් හා බැරකම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එළඹෙන වර්ෂය සඳහා වෙන්කර දී ඇති විට පමණක් වුවද , ඊට පටහැනිව වැය විෂය අංක 2001 සඳහා 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ලෙස රු.3,000,000ක් ව තිබියදී රු.8,079,750 ක් සඳහා බැරකම් වලට එළඹ තිබුණි.	මේ සඳහා 2025 වර්ෂයේදි අමතර ප්‍රතිපාදන ලෙස රු 6,700,000 මහා භාණ්ඩාගාරය වෙතින් අනුමත කර ගෙන ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.
(ඇ)	වැය විෂය අංක 2001 සඳහා බැරකම් වටිනාකම ලෙස රු. 8,079,750ක් දක්වා තිබුණද භාණ්ඩාගාරය විසින් පවත්වා ගෙන යනු ලබන සමුච්චිත වගකීම් වාර්තාවට ඇතුළත් කර තිබුණේ 2024 දෙසැම්බර් 31 දිනට වගකීම් ශේෂය ලෙස රු. 6,700,000ක් පමණි.	CIGAS වැඩ සටහන යටතේ වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතුලත් කිරිමට අවසර නොමැති බැවින් 304-2-1-0-2001 වැය විෂය යටතේ ඉතිරිව පැවති රු 6,700,000 ක ප්‍රතිපාදන සඳහා පමණක් බැරකම් ඇතුලත් කර ලදි.	වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීම් ඇති කර නොගත යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම සමාලෝචන වාර්තාව සකසමින් පවතින අතර එය සකසා අවසන් කර ඉදිරිපත් කිරිමට නියමිත බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**2018 අංක 19 දරන ජාතික විගණන පනත** 16(2) උපවගන්තිය	-	2024 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023 කාර්ය සාධන වාර්තාව 2024.06.25 දින ඉදිරිපත් කර ඇති බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**				
(i)	2008 පෙබරවාරි 06 දිනැති චක්‍රලේඛය අංක 05/2008- 1.4 XVIII වගන්තිය	-	ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර තිබූ නමුත් සේවා ප්‍රඥප්තිය පිළිබඳව අදහස් ලබාගැනීමට හා කාර්යසාධන විගණනයට සුදුසු ව්‍යුහයක් සැකසීම සඳහා අඩුම තරමින් මාස 06කට වරක් ප්‍රඥප්තිය පිළිබඳ සමාලෝචනය කිරීමක් සිදු කර නොතිබුණි.	දෙපාර්තමේන්තු ප්‍රඥප්තිය වෙබ අඩවියේ එල කර ඇති අතර, දැක්ම මෙහෙවර සහ සේවා ලාභීන්ට අදාල ස්ථාන වෙත නිවැරදිව ප්‍රවේශ විය හැකි අයුරින් ප්‍රදර්ශන පුවරු ප්‍රදර්ශනය කර ඇත. එසේම සමාලෝචන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ කටයුතු තව දුරටත් සිදු කරමින් පවතින බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	2019 අප්‍රේල් 19 දිනැති අංක 3/2017, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2001 අගෝස්තු	24,318,541	වේලාව පදනම් කරගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ආදි නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා, කාලය පදනම් කරගෙන සිදු	සියළු දිස්ත්‍රික් කාර්යාල වල පැමිණීමේ පිටවීමේ ලේඛන පරීක්ෂා කර අදාළ අධීක්ෂණ නිළධාරියාගේ නිර්දේශ සහිතව ප්‍රධාන කාර්යාල	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	07 දිනැති 15/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය		කරන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් මගින් සනාථ කල යුතු වුවත්, ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීමකින් තොරව 2024 වර්ෂය සඳහා නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු.24,318,541ක මුදලක් ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය.	වෙත ලැබෙන අතිකාල වවුචර් නියමිත අනුමැතිය යටතේ ගෙවීම් කරනු ලැබීය. 2025 ජනවාරි වන විට සියළු කාර්යාල තුළ ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කර ඇති අතර එමගින් ලැබෙන වාර්තා අනුව අති කාල පැය ගණන් ගණනය කිරීමට කටයුතු කරනු ලබන බව.	
(ඇ)	2017 ජනවාරි 16 දිනැති මුදල් අමාත්‍යාංශ අංක 08/2016 දරණ චක්‍රලේඛය	-	ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල විය යුතු වුවත් ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන පරිදි සකස් කර නොතිබුණි.	2024 වර්ෂයේ තුල නිතර ප්‍රතිපාදන සංශෝධනයන්ට ලක් වූ බැවින් එම සංශෝධනයන්ට අනුව වර්ෂය තුල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර එසේ අවසාන සංශෝධිත අයවැය ප්‍රතිපාදන වලට අනුව 2024 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් සඳහා ඉල්ලුම් කලද ප්‍රතිපාදන ලබා නොදිම හේතුවෙන් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සංයුක්ත සැලැස්මේ CResMPA ව්‍යාපෘති යටතේ අයිතම 17ක් සඳහන් වුවද, ඉන් 2024 වර්ෂයේදී සිදු කිරීමට නියමිත අයිතම වෙන් වෙන්ව හඳුනාගෙන ක්‍රියාකාරී	මේ සඳහා සියළු තොරතුරු දෙපාර්තුමේන්තුව සතුව නොමැති අතර, එම තොරතුරු කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පවතින දේශගුණික ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය	සංයුක්ත සැළැස්මේ සඳහන් සමාලෝචිත වර්ෂයට අදාළ ව්‍යාපෘති අයිතම ක්‍රියාකාරී සැළැස්මට

සැළැස්මේ සඳහන් කර නොතිබුණු අතර එම එක් එක් අයිතමයන්හි ප්‍රගතියද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	(CResMPA) පිළිබඳ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය සතුව පවතින බවත් මෙම අයිතම 17ට අදාල මිලදී ගැනීම් සිදු කර දෙපාර්තුමේන්තුව වෙත බාරදීම ඇතුළු සියළුම ප්‍රසම්පාදන කටයුතු CResMPA ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදුකරනු ලබන බවත් අප දෙපාර්තුමේන්තුව විසින් මෙම අයිතම සඳහා අවශ්‍ය පිරිවිතර සහ අනෙකුත් අවශ්‍යතා CResMPA ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම අයිතම දෙපාර්තුමේන්තුව වෙත ලැබෙන තෙක් ඒවායේ ප්‍රගතිය රඳා පවතින්නේ CResMPA ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය වෙත බව.	ඇතුළත් කළ යුතුය.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා සකස් කළ ක්‍රියාකාරී සැළැස්මේ වැය විෂය අංක 2001 යටතේ රත්නපුර හා පොතුවිල් කාලගුණ විද්‍යා කාර්යාලය අලුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන 10ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණු අතර සංශෝධිත ක්‍රියාකාරී සැළැස්මට අනුව එම රුපියල් මිලියන 10 ප්‍රධාන කාර්යාලය, රත්නපුර, මහ ඉලුක්පල්ලම, ත්‍රිකුණාමලය හා කටුගස්තොට යන කාලගුණ විද්‍යා කාර්යාලයන් අලුත්වැඩියා කිරීම සඳහා වෙන් කර තිබුණි. එසේ වුවද මෙම අලුත්වැඩියාවන් කිසිවක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි. එමෙන්ම, 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාවට අනුව, වැය විෂය අංක 2001 සඳහා අනුමත ප්‍රතිපාදන වලින් රු. 2,154,600 ක් ක්‍රියාකාරී සැලැස්මේ හෝ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් නොවූ පුත්තලම හා මඩකලපුව කාලගුණ විද්‍යා කාර්යාල වල බහාලුම් පෙට්ටි සවි කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.	2024 වර්ෂය අවසාන කාලයේ පුත්තලම හා මඩකලපුව කාලගුණ විද්‍යා කාර්යාල වල තවදුරටත් රාජකාරි ඉටුකිරීමට නොහැකි තත්ත්වයකට හා එහි වාසය කිරීමට නොහැකි තත්ත්වයකට එම කාර්යාල අබලන්වී තිබුණි. මේ හේතුවෙන් 2024 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ සඳහන්වූ කාර්යාල වෙනුවට පුත්තලම හා මඩකලපුව කාලගුණ විද්‍යා කාර්යාල සඳහා ප්‍රමුඛතාවය ලබාදී එම කාර්යාල අලුත්වැඩියා කිරීම සඳහා යොමු වූ නමුත් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කාලයක් නොතිබුණි. එම කාර්යාල CResMPA ව්‍යාපෘතිය හරහා අලුත්වැඩියා කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන නිසාත් මෙම කාර්යාල දෙක වසා තැබීමට නොහැකි නිසාත් තාවකාලිකව බහාලුම් පෙට්ටි සවි කිරීමට තීරණය කරන ලදී. එහෙයින් එම රුපියල් මිලියන 10න් 2024 වර්ෂය තුල රුපියල් මිලියන 03කට අසන්න මුදලක් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් නොවූ බහාලුම් පෙට්ටි සවිකිරීමේ අත්තිකාරම් මුදල් ලෙස සහ අනෙකුත් දෙපාර්තුමේන්තු අවශ්‍යතා සඳහා ගෙවීමට සිදුවූ බව.	සමාලෝචිත වර්ෂය තුලදී සිදු කළ යුතු ප්‍රසම්පාදනයන් නිසි අධ්‍යයනයකින් සහ ප්‍රමුඛතාවයන් අනුව හඳුනාගෙන සැළසුම් කළ යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාලගුණ තොරතුරු නිරීක්ෂණය කිරීමට, පුරෝකථනය කිරීමට හා බෙදාහැරීමට, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ධාරිතාව දියුණු කිරීමේ අරමුණින්, ඩොප්ලර් රේඩාර් පද්ධතිය (JICA) පුත්තලම කාලගුණ මධ්‍යස්ථාන භූමියේ ස්ථාපනය කිරීම සඳහා 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය වන විට රු. මිලියන 1,965.08 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දිනට වියදම රු. මිලියන 0.740ක් පමණක් වී තිබුණි. ගිවිසුම්ගත වී වසර 06 ක් (2019-2025) ගත වී ඇතත් රේඩාර් පද්ධති ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් කළ යුතු වුවත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් මාසයේදී පුත්තලමේ හා උපකරණයේ නිෂ්පාදන කටයුතු ජපානයේ දී ආරම්භ කර තිබුණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 25%ක් පමණක් වී තිබුණි.	පුත්තලම් කාලගුණ රේඩාර් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ හේතූන් මත සිදුවුවකි. 2019 අප්‍රේල් සිදුවූ පාස්කු ප්‍රහාරය හා COVID-19 වසංගතය හේතුවෙන් පැවැති සෞඛ්‍ය සීමා නිසා මෙම ව්‍යාපෘතිය ප්‍රමාද විය. 2021 දී ජපානය තුළ ජාත්‍යන්තර ටෙන්ඩරය පැවැත්වුණු අතර එයට එක් සමාගමක් පමණක් ප්‍රතිචාර දක්වා තිබුණි. ගෝලීය මිල ඉහළ යාම සහ ආර්ථික අස්ථාවරතාවය මත ව්‍යාපාරික අවදානම් සලකා බලමින් එම සමාගමද පසුව ටෙන්ඩරයෙන් ඉවත් විය. මෙම ව්‍යාපෘතිය JICA ආධාර මුදල් (grant) මත පදනම් වූ බැවින්, එය බදු රහිත ව්‍යාපෘතියක් ලෙස සැලකිය යුතුය. ඒ අනුව, මෙහි දේශීය බදු (උදාහරණයක් ලෙස VAT, NBT, PAL) ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතුය. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් ඉල්ලීම සිදු කළද, 2021 දී ආරම්භ කරන ලද මිලදී ගැනීමේ ක්‍රියාවලිය අසාර්ථක වීමෙන් අනතුරුව එම මුදල් වියදම්කල නොහැකි විය. JICA ආයතනය නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද්දේ 2024 වසරේදීය. 2024.04.26 දින අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුමට අනුව එහි කාලය 2028.07.15 දක්වා දීර්ඝ කර ඇත. ඒ අනුව JICA ආයතනය නැවත මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර මේ වන විට නිසියාකාරව සිදු වන බව.	ව්‍යාපෘති නියමිත කාල වකවානු වලදී අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	වැඩිදියුණු කරන ලද කාලගුණ සහ ගංවතුර පූර්ව අනතුරු දැනුම් දීම තුළින් ප්‍රතිලාභ ලබන පුද්ගලයින් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා ක්‍රියාත්මක උක්ත ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර ප්‍රවේශය (CResMPA) ව්‍යාපෘතිය (2021-2026) මගින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂක ජාල වැඩිදියුණු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් (USD) මිලියන 4.5 ක් අනුමත වී තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම ඇමරිකානු ඩොලර් (USD) මිලියන 0.85 ක් වී තිබුණි. ගිවිසුම් ගත වී වසර 03 ක් ගත වී ඇතත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියේ භෞතික සමුච්චිත ප්‍රගතිය 40%ක් පමණක් වී තිබුණි.	මේ සඳහා සියළු තොරතුරු අප දෙපාර්තුමේන්තුව සතුව නොමැති අතර, එම තොරතුරු කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පවතින දේශගුණික ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) පිළිබඳ ව්‍යපෘති අධ්‍යක්ෂ කාර්යාලය සතුව පවතී. මෙම අනුමත මුදල් වියදම් කිරීමේදී සියළුම ප්‍රසම්පාදන කටයුතු CResMPA ව්‍යපෘති අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදුකරනු ලබන අතර කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව විසින් මෙම සමහර මිලදී ගැනීම් සඳහා අවශ්‍ය පිරිවිතර සහ අනෙකුත් අවශ්‍යතා CResMPA ව්‍යපෘති අධ්‍යක්ෂ කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම වියදම් කිරීම CResMPA ව්‍යපෘති අධ්‍යක්ෂ කාර්යාලය විසින් සිදු කරන බව.	ව්‍යාපෘති නියමිත කාල වකවානු වලදී අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා ඉදිරිපත් කළ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු. මිලියන 10ක් වූ ප්‍රසම්පාදනයන් 04ක් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, නියමිත ප්‍රමිතියෙන් තොරව ලබා දීම හා TRCSL අනුමැතිය ලැබී නොතිබීම හේතුවෙන් වර්ෂය තුල සිදුකිරීමට අපොහොසත් වී තිබුණි.	ඇතැම් වැය විෂයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති විම හේතුවෙන් ප්‍රමුඛතාවය ලබා දී අවශ්‍ය උපකරණ මිලදී ගත් අතර ඇතැම් උපකරණ මිලදී ගැනිම අත්හිටුවීමට සිදු විය. තවද ඇතැම් උපකරණ ගෙන්වනු ලබන ආයතනය විසින් TRCSL ආයතනයේ අනුමැතිය ලබා ගැනිම ප්‍රමාද වූ බැවින් 2024 දෙසැම්බර් 31 වන දිනට බිල්පත් ඉදිරිපත් කර නොතිබූ බව.	ප්‍රසම්පාදන සැළසුමට අනුව කාර්යයන් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය		
ප්‍රධාන කාර්යාලය මගින් පුත්තලම ප්‍රාදේශීය කාර්යාල වෙත භාණ්ඩ සැපයීමේදී කාර්යාලයේ අවශ්‍යතාවය, පවතින ඉඩකඩ ප්‍රමාණය, භාණ්ඩ වල කල්පැවැත්ම කෙරෙහි අවධානය යොමු නොකර රු. 236,000ක් වූ Lobby Chair 02 ක් සපයා තිබුණු අතර ඒවා ඌන උපයෝජිතව පැවතුණි. එමෙන්ම අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව සපයා තිබුණ HD Web Cam උපකරණය විගණිත දිනය වනවිටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණ අතර කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා නිකුත් කරන ලද දැන්වීම් පුවරුව සහ 1:500000 ලංකා සිතියම ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.	කාර්යාලීය අවශ්‍යතාව අනුව ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ මෙම භාණ්ඩ මිලදී ගෙන ඇති අතර කාර්යාලය නවීකරණය වීමත් සමග මෙම භාණ්ඩ ඉදිරියේදී අවශ්‍යය වනු ඇත. රේඩාර් ව්‍යාපෘතිය සමග කාර්යාලයේ යම් ඉඩකඩ සීමා වීමක් සිදුවූ බැවින් තාවකාලිකව විවේක කාමරය තුල තිබූ පුටු භාවිතයට ගත හැකි බවත් කන්ටේනර් පෙට්ටි වලින් සාදන ලද ගොඩනැගිල්ල මෙම භාණ්ඩ ලැබීමෙන් පසුව සිදුවූවක් වන අතර මෙම භාණ්ඩ ඉදිරියේදී භාවිතයට ගනු ලබයි. සෑම කාලගුණ විද්‍යා කාර්යාලයකටම web cam සපයන ලද්දේ හදිසි අවස්ථාවකදී මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තු තීරණයකට අනුව වන අතර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව ඉදිරියේදී භාවිතයට ගනු ලැබේ. තවද, සෑම කාලගුණ විද්‍යා කාර්යාලයකටම ලංකා සිතියම සපයන ලද්දේ යම් අවස්ථාවකදී යම් ස්ථානයක පිහිටීම හෝ වෙනත් අවශ්‍ය කරුණක් වේනොත් බලා ගැනීම සඳහා වන බව.	අදාළ යන්ත්‍ර උපකරණ හා අනෙකුත් වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ) ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය		
ප්‍රධාන කාර්යාලය මගින් ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය වෙත භාණ්ඩ සැපයීමේදී කාර්යාලයේ අවශ්‍යතාවය සහ පිහිටීම හඳුනාගැනීමකින් තොරව රු. 236,000ක් වූ Lobby Chair 02 ක් සපයා තිබුණු බැවින් මාස 04ක් ගත වීමටත් පෙර මළකඩ බැඳී ඌන උපයෝජිතව පැවතුණි. එමෙන්ම අවශ්‍යතාවය හඳුනා ගැනීමකින්	කාර්යාලීය අවශ්‍යතාව අනුව ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ මෙම භාණ්ඩ මිලදී ගෙන ඇති අතර කාර්යාලය නවීකරණය වීමත් සමග මෙම භාණ්ඩ ඉදිරියේදී අවශ්‍යය වනු ඇත. ඉදිරියේදී මෙම පුටු සහ අනෙකුත් භාණ්ඩ නිසි පරිදි ස්ථාන ගත කෙරෙනු ඇත. සෑම කාලගුණ විද්‍යා කාර්යාලයකටම web	අවශ්‍යතාවය හඳුනාගෙන අවශ්‍ය අවස්ථාවේදී යන්ත්‍ර හා උපකරණ ප්‍රාදේශිය කාර්යාල වලට ලබා දීමට කටයුතු කළ යුතුය.

	තොරව සපයා තිබුණ Web Cam උපකරණ සහ 2TB දෘඩ තැටිය ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා නිකුත් කරන ලද 1:500000 ලංකා සිතියම සහ දැන්වීම් පුවරුවද විගණිත දිනය වන විටත් ප්‍රදර්ශනය කර නොතිබුණි. තවද දැන්වීම් පුවරුව තොග ලේඛනයටද ඇතුලත් කර නොතිබුණි.	cam සපයන ලද්දේ හදිසි අවස්ථාවකදී මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පැවැත්වීම සඳහා වන අතර 2 TB Hard disk දී ඇත්තේ යම් ලෙසකින් පරිඝනකය අක්‍රිය වුවහොත් එම කාර්යාලයේ කාලගුණ විද්‍යා දත්ත ලබා ගත නොහැකි වන බැවින් ආරක්ෂිත දත්ත ගබඩාවක් (Back-up) ලෙස භාවිතා කිරීමටවේ. එසේම ඉන්වෙන්ට්‍රි පොතෙහි මෙම උපකරණය ඇතුලත් කිරීම අතපසු වී ඇති බැවින් වහාම එය ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙසත් දැනුම් දී ඇත. ලංකා සිතියම සහ දැන්වීම් පුවරුව නිසි පරිදි තොග ලේඛනයට ඇතුලත් කර ඇති බව.	
(ඇ)	දෙපාර්තමේන්තුව සතු රු.4,000,000 ක් පිරිවැය වූ අංක 57-8845 දරණ කැබ් රථය වර්ෂ කිහිපයක සිට ධාවනයෙන් ඉවත් කර තිබී 2024 මැයි මාසයේදී රු.796,200 ක මුදලක් වැය කර අලුත්වැඩියා කර මාස 03ක් පමණක් ධාවනය කර නැවත ධාවනයෙන් ඉවත් කර තිබුණි. විශාල වියදමක් දරා අලුත්වැඩියා කරන ලද වාහනය භාවිතයට සුදුසු තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. එමෙන්ම, පිරිවැය රු.5,400,000ක් වූ PC-1140 හා පිරිවැය රු.2,900,000ක් වූ PA-4029 දරන කැබ් රථ අලුත්වැඩියා කටයුතු සිදු නොවීම නිසා ධාවනයෙන් ඉවත් කර තිබුණද, එම වාහන භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	මෙම රථය වසර දෙකකට ආසන්න කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර, 2024 වර්ෂයේදී එන්ජින් අළුත්වැඩියාවක් සිදු කර ධාවනය සඳහා යොදවන ලදී. මාස කිහිපයක් ධාවනයෙන් පසු රථයේ ටයර් හා රිම් යෙදිය යුතු වුවත් 2024 වර්ෂයේ ප්‍රතිපාදන සීමිත වූ බැවින් මෙම රථය සඳහා ටයර් හා රිම් කට්ටල යෙදවීමට නොහැකි විය. 2025 දෙවන කාර්තුව තුලදී ටයර් හා රිම් කට්ටල යෙදවීමට නියමිත බව. තවද, PC-1140 සහ PA-4029 යන රථ අළුත්වැඩියා කිරීම සඳහා සියළු ප්‍රසම්පාදන කටයුතු සිදු කර අළුත්වැඩියාව සඳහා යොමු කිරීමට කටයුතු කරන බව.	වාහන නිසි පරිදි අලුත්වැඩියා කර ධාවනයට යොදා ගත යුතුය.
(ඈ)	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සවිකර ඇති ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 37න් මධ්‍යස්ථාන 04ක් අක්‍රීයව පවතින අතර මධ්‍යස්ථාන 02ක් ඉවත් කර තිබුණි. හදිසි කාලගුණ වෙනස්වීම් තත්ත්වයන්හිදී ස්වයංක්‍රීය දත්ත ලබාගැනීමේ හැකියාව ඉතා වැදගත්වන නමුත් අක්‍රීයව පවතින මෙම මධ්‍යස්ථාන නඩත්තු කටයුතු සිදු කර ක්‍රියාකාරී	ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 31 ක දත්ත Online හෝ Offline ලෙස ලබා ගත හැකිය. ඉතිරි පද්ධතීන්ගෙන් එක් පද්ධතියක් ත්‍රිකුණාමලය කාර්යාලය තුළ ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු අවසන් කර ඇති අතර, ඊට අවශ්‍ය ද්‍රව්‍ය කිහිපයක් මිළදී ගැනීම සඳහා ප්‍රසම්පාදන අංශයට යොමු කර ඇත.	ක්‍රියා විරහිත තත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන ක්‍රියාකාරී තත්වයට පත් කළ යුතුය.

	තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	තවත් එක් පද්ධතියක් මුලතිව් කාර්යාල භූමියේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. අනෙක් පද්ධතීන්ගේ දත්ත ගබඩාවල ඇති අඩුපාඩු සඳහා අවශ්‍ය අමතර කොටස් මේ වන විට නිෂ්පාදනයේ නොමැති බැවින් JICA ව්‍යාපෘතිය හරහා හඳුන්වා දෙනු ලබන දත්ත ගබඩා පද්ධති ලෝක බැංකු ව්‍යාපෘතිය හරහා මේ වන විට ඇණවුම් කර ඇත. ඒවා ලැබීමෙන් පසුව, පරීක්ෂා කටයුතු නිම කර සියල්ල පූර්ණ ක්‍රියාකාරී තත්වයට පත් කිරීමේ හැකියාව ඇති බව.	
(ඉ)	දිවයින පුරා සාම්ප්‍රදායික වැසි මාපක 460ක් විසිරී පවතින අතර වර්තමාන ක්‍රියාකාරීත්වය හා දත්ත ලැබීම් අනුව සාම්ප්‍රදායික වැසි මාපක 420කින් පමණක් දත්ත ලබාගැනීම සිදු වන අතර වැසි මාපක 40කින් දත්ත අඛණ්ඩව නොලැබේ. මෙම වැසි මාපක වල නඩත්තු කටයුතු සිදු කර නොතිබූ අතර ඉවත් කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 03ක් විය.	මෙම උපකරණ භාවිතයෙන් දත්ත අපවෙත ලබාදීම ස්වේච්ඡා සේවාවක් ලෙස බාහිර පාර්ශවයන් විසින් ඉටුකරදෙන සේවයක් වන අතර උපකරණ පිරිසිදුව තබගැනීම් සහ අවට පරිසරය මනාව පවත්වාගෙන යාම ඔවුන් විසින් සිදු කරන අතර මේවායේ විශේෂ නඩත්තු කිරීමක් සිදු නොකෙරේ. ඉදිරියේදී පවතින ප්‍රතිපාදන මත හැකි උපරිම අයුරින් නඩත්තු කටයුතු කරනු ලබන බව.	අඛණ්ඩව දත්ත නොලැබෙන වැසි මාපක අඛණ්ඩව දත්ත ලැබෙන පරිදි අළුත්වැඩියා කළ යුතුය.
(ඊ)	දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාන 122ක් පවතින අතර 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂාමාන 84ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර 33ක් අක්‍රීය වී තිබුණි. නිසි පරිදි නඩත්තු නොකිරීම ඊට හේතු වී ඇති අතර ඉවත් කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 05ක් විය.	මෙම ස්වයංක්‍රීය වර්ෂාමාන 122 න් පද්ධති 22 ක් මේ වන විටත් ස්ථාපනය කළ ආයතනයේ වගකීම් කාලය තුල පවතී. එයින් 12 ක් මේ වන විට අක්‍රීය වී ඇති අතර ඒ පිළිබඳව අදාළ ආයතන ඇනුවත් කර ඇත. මීට පෙර මෙම 12 න් 09 ක් පිළිසකර කරන ලෙස ලිපිද යොමු කර ඇත. ඉතිරි 100 න් 74 ක් මේ වන විට ක්‍රියාකාරී තත්වයේ ඇත.05 ක් ඉවත් කර ඇත. ඒවා නව ස්ථාන හඳුනා ගෙන ස්ථාපිත කිරීමට නියමිතය. ඉතිරි 21 අළුත්වැඩියා කරමින් පවතින බව.	අක්‍රීය වර්ෂාමාන ක්‍රියාත්මක තත්වයට පත් කර නිසි පරිදි නඩත්තු කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) නිර්දේශ අනුව ගුවන්තොටුපල සඳහා කාලගුණ විද්‍යා දත්ත ලබාදීමේ ප්‍රධාන අරමුණක් වනුයේ ගුවන් මගින් සහ ගුවන්තොටුපල කාලගුණ විපත්වලින් ආරක්ෂා කිරීම වුවත් යාපනය කාර්යාලය මගින් නිකුත් කරන METAR සහ ගණිතමය ආකෘතිමය දත්ත උපයෝගී කරගෙන කටුනායක කාලගුණ විද්‍යා කාර්යාලය විසින් පළාලි ගුවන්තොටුපල සඳහා ගුවන්තොටුපල කාලගුණ අනාවැකි TAF නිකුත් කර තිබූ අතර එම කාර්යාලයේ අනාවැකි වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ස්ථානීය දත්ත නොමැති වීම නිසා පළාලි ගුවන්තොටුපලට TAF නිකුත් කිරීම 2023 ජූනි 01 දින සිට නවතා තිබුණි.	ස්ථානීය දත්ත ලබා ගැනීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා ගුවන් තොටුපොල සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ අදාල නිලධාරීන් සමඟ 2025 මැයි මස අගදී සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන බව.	ස්ථානීය දත්ත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.
(ආ)	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව නිල නිවාස 18ක් පැවතියද, ඉන් 14ක් පමණක් භාවිතයේ පැවතුණි. පොතුවිල්, පුත්තලම, නුවරඑළිය, මඩකලපුව නිල නිවාස භාවිතයට සුදුසු නොවන අන්දමින් අබලන්ව පැවති අතර එම නිල නිවාස භාවිතයට ගැනීමට අවශ්‍ය සුදුසු පියවර ගෙන නොතිබුණි. එමෙන්ම භාවිතයේ නොපවතින නිල නිවාසවලද ජල බිල්පත් සඳහා 2024 අගෝස්තු මාසය දක්වා රු.60,217 ක් ද විදුලි බිල්පත් සඳහා 2024 අගෝස්තු මාසය දක්වා රු.50,653 ක් ද ගෙවා තිබුණි.	පසුගිය වසර වල මෙම නිල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ක්‍රමක්‍රමයෙන් බොහෝ නිල නිවාස අබලන් තත්ත්වයට පත්විය. සුළු අලුත්වැඩියා කටයුතු සිදු කලද එමගින් නඩත්තු කටයුතු නිසි පරිදි පවත්වාගෙන යා නොහැකි විය. ලෝක බැංකු ව්‍යාපෘතිය (CResMPA) යටතේ සියළුම ප්‍රාදේශීය කාර්යාල සහ නිල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා වී ඇති අතර ඉදිරියේදී මේ සියල්ල නවීකරණය වන බව.	නිලනිවාස භාවිතයට ගැනීමට සුදුසු පරිදි නවීකරණය කළ යුතුය.

(ඇ)	අනුරාධපුරය,මඩකලපුව, කටුගස්තොට, මහඉලුප්පල්ලම, මන්නාරම, කුරුණෑගල, වව්නියාව, මුලතිව්, හම්බන්තොට, ගාල්ල යන කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි ප්‍රදේශ 10 ක් දෙපාර්තමේන්තුව වෙත 2024 දෙසැම්බර් 31 දින වන විටත් පවරාගෙන නොතිබුණි.	මෙම කාර්යාල දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව.	කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සෘජුව දායක වන තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබූ නමුත් 2024 වර්ෂයට අදාළව සිදු කර ඇති ක්‍රියාකාරකම් හා එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව ප්‍රගතියෙහි ප්‍රතිශතයන් ගණනය කර නොතිබුණි.	සිදුකරමින් පවතී.	තිරසර සංවර්ධන ඉලක්කයන්ට අදාළ ප්‍රගතියෙහි ප්‍රතිශතයන් ගණනය කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 460 ක් වන අතර සත්‍ය සේවක සංඛ්‍යාව 342 ක් වූයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18ක්, තෘතියික මට්ටමේ තනතුරු 21ක්, ද්විතියික මට්ටමේ තනතුරු 64ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 15ක් වශයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 118 කි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු වන කාලගුණ විද්‍යාඥ, ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු තනතුරු දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරු වල කාර්යයන් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට ඉමහත් දායකත්වයක් සපයන බැවින් එකී තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමට ක්‍රියා නොකිරීමෙන් ආයතනයේ කාර්යසාධනය, අරමුණු හා කාර්යයන් නිසි ලෙස පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි.	මේ වන විට පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් සහ අගමැති කාර්යාලයේ බඳවා ගැනීම් සමාලෝචනය කිරීමේ කමිටුව වෙත ඉල්ලීම් කර ඇත. එකී අනුමැතිය ලැබීමෙන් පසු බඳවා ගැනීම් සිදු කිරීමට හැකියාවක් පවතී.	දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.